චීන ජාතිකයින් සම්බන්ධයෙන් වන යම් සෘණාත්මක සිදුවීම් හෝ සෘණාත්මක සන්දර්භයන් වාර්තා කිරීමේදී, බොහෝ විට මාධ්‍ය "චීනා", "චීන්නු", "චීනුන්" වැනි යෙදුම් භාවිතා කරනු දක්නට ලැබේ. මෙවැනි අපහාසාත්මක ස්වරයකින් භාවිතා වන යෙදුම් ඔස්සේ, එම ජනවර්ගය අප සමාජය තුළ සෘණාත්මකව ඒකාකෘතික නොවනු ඇතිදැයි පාඨක අප විමසිය යුතුයි.
එසේම, මෙවැනි යෙදුම් දිගින් දිගටම මාධ්‍ය විසින් භාවිතා කිරීම, සමාජය තුළ චීන ජාතිකයින් කෙරෙහි විදේශික භීතිකාවක් (xenophobia)ජනිත කිරීමට පවා හේතු විය හැක.
පරිගණක අපරාධයන්ට සම්බන්ධ යැයි පැවසෙන චීන ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට පත්වීමේ සිදුවීමක් සම්බන්ධයෙන්, අප්‍රේල් 03, 2023 දින පුවත් වාර්තාවන් කිහිපයක් ඔස්සේ ආවරණය වී තිබුණේ මෙලෙසිනි.
"කෝටි ගණනක මුදල් වංචා සම්බන්ධයෙන් චීන ජාතිකයන් පිරිසක් අත්අඩංගුවට" - අද
"චීනුන් 38ක හොර රැළක් අත්අඩංගුවට" - ලංකාදීප
"අන්තර්ජාලයෙන් ලොව පුරා මුදල් වංචා කළ චීනුන් 38ක් අලුත්ගමින් අල්ලයි" - මව්බිම
"රතු නිවේදන සහිත 3 ක් ඇතුළු චීන්නු 39ක් කළුවාමෝදරදී කොටු වෙති" - දිනමිණ
"පරිගණක අපරාධයකට සූදානමින් සිටි චීන්නු 38ක් මාට්ටු" - දිවයින
ඔබ සිතන ලෙසට,
1) අද පුවත් සිරස්තලය "චීන ජාතිකයින්" යනුවෙන් සඳහන් කර තිබෙන විට, ලංකාදීප, මව්බිම, දිනමිණ සහ දිවයින පුවත්පත් සිරස්තල තුළ, "චීනුන්", "චීන්නු" වැනි යෙදුම් භාවිතා කර ඇත්තේ මන්ද?
2) "චීනුන්", "චීන්නු" වැනි යෙදුම් ඔස්සේ, චීන ජාතිකයින් කෙරෙහි අවමානාත්මක, කොන් කිරීමේ අදහසක් ජනිත නොවනු ඇති ද?
3) එසේ නම්, වඩාත් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වෙමින් මෙම පුවත වාර්තා කර ඇති පුවත් වාර්තාව(න්) ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!
202


"චීන්නු", "චීනුන්" ද? "චීන ජාතිකයන්" ද?
ETHICS EYE
මගඩියට ලෝකයම තිප්පොළක් කරගෙන
චීනුන් 38 ක හොර රැළක් අත්අඩංගුවට
ලැප්ටොප් 40ක්-ජංගම දුරකතන 120 ක් පොලිස් භාරයට
අලුත්ගමින් ගෙයක් අරගෙන ජාවාරම කරගෙන ගිහින්
ලංකාදීප
2023-04-03
දිනමිණ
2023-04-03
රතු නිවේදන සහිත 3ක් ඇතුළු
චීන්නු 39ක් කළුවාමෝදරදී කොටු වෙති
පරිගණක අපරාධවලට යෙදවූ බවත් හෙළි වේ
කෝටි ගණනක මුදල් වංචා සම්බන්ධයෙන්
චීන ජාතිකයන් අත්අඩංගුවට
අද
2023-04-03
අන්තර්ජාලයෙන් ලොව පුරා මුදල් වංචා කළ චීනුන් 38ක් අලුත්ගමින් අල්ලයි
මාස 2ක්ම හෝටලයක ඉඳලා
ලැප්ටොප් 40ක් ජංගම දුරකථන 120ක් පොලිස් භාරයට
මව්බිම
2023-04-03
දිවයින
2023-04-03
පරිගණක අපරාධයකට සදානමින් සිටි
චීන්නු 38ක් මාට්ටු